**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2022-09-08 |
|---|---|---|---|

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එම්.කේ. කුලතුංග මිය,<br>අංක. 241/1,කටුගස්තොට පාර,<br>මහනුවර. |
| වගඋත්තර පාර්ශවය | : | පො. ප.රංජිත් ජයසේන මයා,<br>ස්ථානාධිපති (විවිධ පැමිණිලි අංශය),<br>මූලස්ථාන පොලිසිය,<br>මහනුවර. |
| <u>පැමිණිලි අංකය</u> | : | **<u>HRC/K/54/2019</u>** |

**පැමිණිල්ලේ සැලකිරිම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මහනුවර සිට කටුගස්තොට දක්වා ඇති මහාමාර්ගයට මායිම්ව ඇති වැලිකන්ද නම් වූ ගම ආශ්‍රිතව සිදුකරගෙන යනු ලබන පරිසර විනාශය වළකාලීම සඳහා ඊට අදාළ මධ්‍යම පරිසර අධිකාරිය වැනි රජයේ ආයතන සහ ජනාධිපතිතුමාද දැනුවත් කිරීමට තමා විසින් කටයුතු කළ බවත්, 2017 වර්ෂයේ එම භූමිය නායයෑමේ දැඩි අවධානම් කලාපයක් ලෙස නම් කර එහි පදිංචිව සිටි මිනිසුන් ඉවත් කිරිමටද නියෝග කරන ලද බවත්, එකී ස්ථානයේ නීතිවිරෝධි ලෙස පස්කැපිමක් සිදුකරන ලද අතර, අදාළ ආයතන දැනුවත් කිරිමෙන් පසු අදාළ පුද්ගලයාට නඩුවක් පවරා වරදකරු වී ඇප මත මුදාහරින ලද බවත්ය.

කරුණු එසේ තිබියදි ඉහත කී පුද්ගලයාගේ මෙහෙයවීම මත පිරිසක් විසින් තමාට විරුද්දව මහනුවර පොලිසියේ විවිධ පැමිණිලි අංශයට 2019.01.11 දිනැතිව පැමිණිල්ලක් සිදුකර ඇති බවත්, එකී පැමිණිලි විභාගය 2019.01.17 දින පවත්වන ලද බවත්, ඔවුන්ගේ පැමිණිල්ල අනුව ගමට යාමට පාරක් කැපිමට විරුද්ධව තමා නොයෙකුත් රාජ්‍ය ආයතන වෙත පැමිණිලි කරමින් එය වළකාලන බැවින් තමාට එරෙහිව අධිකරණයේ නඩුවක් පවරන ලෙසත් ඉල්ලා ඇති බවත් සඳහන් කර ඇත. පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිල්ල පදනම් විරහිත බවත්, තමාට එය අදාළ නොවන බවත්, පරිසර විනාශයක් ගැන පමණක් තමා අදාළ ආයතන දැනුවත්



ප්‍රධාන කාර්යාලය 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. සභාපති ෆැක්ස් ඊමේල්

කිරිමක් පමණක් සිදුකර ඇති බවත්ය. නමුත් මෙම පැමිණිලි විභාගය පැවැත්වූ පොලිස් නිලධාරින් කරුණු නිසි ලෙස අවබෝධ කරනොගෙන පැමිණිලිකරුවන්ට අවශ්‍ය පරිදි ආරවුලක් ලෙස අර්ථ දක්වා අධිකරණයට යොමු කිරිමට තීරණය කළ බවත්, ඒ අනුව 2019.01.30 දින තමාට මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටීමට සිතාසි යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ල වැඩිදුර ප්‍රශ්න කිරීමකින් තොරව තමාට මෙය විසදිය නොහැකි ආරවුලක් බව සඳහන් කරමින් විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් මෙය මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ඉදිරියේ විභාගය පැවැත්වීමට කටයුතු කළ බවත්, ඒ අනුව මූලස්ථානාධිපතිවරයා මෙය රජයේ ආයතන මැදිහත් වී විසදිය යුතු ප්‍රශ්නයක් බැවින් පොලිසිය විසින් නඩු පැවරිය නොහැකි බව ප්‍රකාශ කර සිටියද, විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් 107 යටතේ ආරවුලක් ලෙස අර්ථදක්වා නඩු පැවරිමට තීරණය කළ බවත් දක්වා ඇත.

ඒ අනුව තමා විසින් පරිසරය සුරැකීමට සහ පොදු දේපළ ආරක්ෂා කිරීමට අදාළව අදාළ ආයතන දැනුවත් කිරිම වෙනුවෙන් එය වරදක් ලෙස සලකා වෙනත් පාර්ශවයක් විසින් සිදුකරන ලද අසත්‍ය පැමිණිල්ලකට කරුණු විමසිමකින් තොරව විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිගේ තීරණය අනුව නඩුවක් පැවරීම තුළින් තමාව පදනම් විරහිතව විත්තිකරුවකු ලෙස අධිකරණය වෙත යොමු කිරීමට කටයුතු කළ බැවින් තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වි ඇති බවත්, ඒ පිළිබඳව පරික්ෂා කර බලා සාධාරණයක් ඉටුකරදෙන ලෙස ඉල්ලා සිටින බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් දන්වා ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරිම :-**

පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය වෙතින් කැඳවන ලද වාර්තාවේ සඳහන් වී ඇත්තේ, මෙම පැමිණිලිකාරියට විරුද්ධව මහනුවර වැලිකන්ද ලිපිනයේ කත්තොට රාළලාගේ කරුණාසේන යන අය විසින් 2019.01.11 දින ස්ථානය වෙත යොමු කරන ලද පැමිණිල්ලට අනුව පැමිණිලිකාරියගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවත්, ඒ අනුව දෙපාර්ශවය කැඳවා 2019.01.17 දින පැමිණිල්ල විභාග කරන ලද අතර, දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇති කර ගැනීමට නොහැකි වීම නිසා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති වෙත ඉදිරිපත් කළ බවත්ය.

මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකතුමා විසින්ද දීර්ඝ ලෙස සාකච්ඡා කර පැමිණිල්ල එකඟතාවයක් ඇති කරගැනීමට නොහැකි වී ඇති අතර, පැමිණිල්ල ඉදිරිපත් කර ඇති කරුණාසේන ඇතුළු පිරිස විසින්, 'මහයියාව දුම්රිය හරස් මාර්ගය අසලින් වැලිකන්ද හරහා කටුගස්තොට ප්‍රධාන මාර්ගයට ගම්වැසියන්ට යාමට තිබූ මාර්ගයේ සංවර්ධන කටයුතුවලට මෙම පැමිණිලිකාරිය බාධා කරන බවත්, එවා වළක්වමින් ක්‍රියාකරන බවත්, පොලිසිය මේ සඳහා මැදිහත් නොවන්නේ නම් පැමිණිලිකාරියගේ නිවස ඉදිරිපිට උද්ඝෝෂණයක් සිදුකරන බවත්' විමර්ශනයේදී සඳහන් කොට ඇත බවට දන්වා ඇත.

පැමිණිලිකාරිය විසින් දන්වා ඇත්තේ, තමා මාර්ගය සෑදීමට විරුද්ධ නොමැති බවත්, නායයෑම් තර්ජන පවතින ප්‍රදේශයක් බැවින් තමා ඒ බැව් අදාළ ආයතන වෙත දැනුම් දීම හා පැමිණිලි සිදුකර ඇති බවත්ය. ඒ අනුව පැමිණිලිකාරිය තනි පාර්ශවයක්ද, ගම්වැසියන් වෙනම පාර්ශවයක්ද ලෙස ආරවුල් කරගන්නා බැවින් මෙම ගැටළුකාරී තත්වය නිවාරණය කිරීම සඳහා සාම නිලධාරින් විසින් සංඥය වරදක් වැළැක්වීම සඳහා උපරිම හැකියාව යොදවා කටයුතු කළ බවත්, ඒ අනුව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 107 වගන්තියට අනුව අධිකරණය ඉදිරියට පමුණුවා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා දෙපාර්ශවය වෙත නඩු පැවරීට කටයුතු කළ බවත් දක්වා ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතුවලදී අනාවරණය වී ඇති කරුණු :-**

1. පැමිණිලිකාරිය පදිංචිව සිටින නිවස ආසන්නයේ තිබෙන වැලිකන්ද ගම නැමැති ප්‍රදේශයේ නායයෑම් සහිත අවධානම් ප්‍රදේශයක් බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2009 වර්ෂයේදී ප්‍රකාශයට පත්කිරීමෙන් පසු එහි පදිංචි පවුල් සඳහා විකල්ප ඉඩම් වෙනත් ස්ථානයකින් ලබාදී නිවාස සාදා ගැනීම සඳහා නිවාස ණය ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාදී ඇති බව නිරීක්ෂණය වී ඇත.

2. එහෙත් මෙම පැමිණිලිකාරියට එරෙහිව මහනුවර පොලිසියට පැමිණිලි කර ඇති එම පැමිණිලිකරු ඇතුළු 06 දෙනාම විකල්ප ඉඩම් සහ නිවාස ණයද ලබාගෙන එහි නිවාස තනා පදිංචි නොවී මෙම නායයෑම් අවධානම් සහිත වැලිකන්ද ග්‍රාමයේ තවමත් පදිංචිව සිටින පුද්ගලයින් වන බවද නිරීක්ෂණය වේ.

3. වැලිකන්ද ග්‍රාමයේ මෙම පුද්ගලයන් පදිංචිව සිටින නිවාස සඳහා ගමන් කිරීමට පඩි පෙලක් තිබී ඇති අතර, මහනුවර යාපනය ඒ-9 මාර්ගය සකස් කිරීමේදී එම පඩිපෙළින් කොටසක් කැඩියාම හේතුවෙන් එය සකස් කරදීමට මාර්ග සංවර්ධන අධිකාරිය සූදානම් වුවද, ඒ වෙනුවට මාර්ගයක් සකස් කර ගැනීමට පොලිස් ස්ථානය වෙත පැමිණිලිකර ඇති නිමල් ජයසිංහ ඇතුළු පිරිස කටයුතු කර ඇත.

4. මේ වන විටත් මාර්ගයක් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගත යුතු කිසිදු ආයතනයකින් නීත්‍යානුකූල අවසරයක් නොමැතිව බලහත්කාරයෙන් මාර්ගයක් සකස්කිරීම සඳහා මෙම පිරිස කටයුතු කර ඇති බවට ඉදිරිපත් වී ඇති කරුණු අනුව තහවුරු වී ඇත.

5. පැමිණිලිකාරිය මෙම නායයෑම් අවධානම් සහිත ප්‍රදේශයේ නීති විරෝධී ලෙස පාරක් ඉදිකිරීමට මෙම ගම්වැසියන් පිරිස කටයුතු කිරීම නිසා ඊට අදාළ සියළු රාජ්‍ය ආයතන දැනුවත් කිරීම පමණක් සිදුකර ඇති අතර, අදාළ ගම්වාසි පිරිස සමඟ කිසිදු ගැටුමක් හෝ ආරවුලක් ඇතිකරගෙන නොමැති බවද නිරීක්ෂණය වේ.

6. එහෙත් මෙම පරිසර විනාශයට එරෙහිව පැමිණිලිකාරිය විසින් අදාළ රාජ්‍ය ආයතන දැනුම්වත් කිරිම හේතුවෙන් 2017.10.13 දින නිමල් ජයසිංහ ඇතුළු ගම්වාසි පිරිසක් විසින් පැමිණිලිකාරියගේ නිවසට පැමිණ පැමිණිලිකාරියට බැණ තර්ජනය කිරිමක් සම්බන්ධයෙන් මහනුවර පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් පොලිසිය විසින් ගෙන නොමැති බවද තහවුරු වී ඇත.

7. එහෙත් පැමිණිලිකාරියට එරෙහිව 2019.01.11 දින නිමල් ජයසිංහ යන අය විසින් සිදුකරන ලද පැමිණිල්ල 2019.01.17 දින විභාගකර ඇති අතර,ඒ සඳහා එම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති නිමල් ජයසිංහ යන අයට අමතරව තවත් සිව් දෙනෙකු සහභාගි කරගෙන ඇත.

8. මෙම පැමිණිල් විභාග කර ඇති සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා මෙම ගැටළුව සඳහා විසඳුමක් ලබාදීමට නොහැකි වීම හේතුවෙන් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකවරයා වෙතද ඉදිරිපත් කිරමෙන් පසු ඔහුගේ උපදෙස් අනුව පැමිණිලිකාරියට එරෙහිව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 107 වගන්තියට අනුව නඩුවක් පවරා ඇති අතර, එය 2019.03.20 දින අධිකරණයේ විභාග කර නඩුව ආරවුල් නොමැති බව දන්වා සිටින බැවින් හේතු දැක්වීමට අවශ්‍ය නොවන බව තීරණය කර පැමිණිලිකාරිය ඇතුළු වගඋත්තරකරුවන් මුදාහරින ලෙස දන්වා ඇති බවද නිරීක්ෂණය වේ.

9. ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකාරිය හා අනෙක් පාර්ශවය අතර, කිසිදු ආරවුලක් නොතිබියදි අදාළ අනවසර මාර්ගය ඉදිකිරීමට අදාළ බලධාරි ආයතන හා අධිකරණය මඟින් තහනම් කර තිබියදි පැමිණිලිකාරිය එයට බාධා කරන බවට අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබියදි, ඒ පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදුනොකොට පැමිණිලිකාරියට එරෙහිව සාමය ආරක්ෂා කිරිම සඳහා බැදුම්කරයකට යටත් කිරිමට අධිකරණය වෙත යොමු කිරීමෙන් පැමිණිලිකාරියට අගතියක් සිදුකර ඇති බවයි.

**නිගමනය :-**

පැමිණිලිකාරිය විසින් සිදුකර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන විරුද්ධව පාර්ශවයක් විසින් ගොනුකර ඇති අසත්‍ය පැමිණිල්ලක් නිසි විමර්ශනයක් නොකර පැමිණිලිකාරියට එරෙහිව නොතිසි නිකුත් කර අධිකරණයට කැඳවීම හේතුවෙන් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ඡේදයේ 12(1) හා (2) වගන්තිවලින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ඡේදයේ 12(1) හා (2) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර

ඇති බැවින් මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරනු ලබන අතර, වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු පියවර ගන්නා ලෙසට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 10 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- 01 පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.
} ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

අධ්‍යක්ෂ,
(පිරිස් හා පාලන)
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.
} වගඋත්තරකරුගේ නව සේවා ස්ථානයට නිර්දේශය යොමු කිරීමට

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර.

B/h